077

ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය

පෙර පාසල් අධ්‍යාපන උසස් සහතික පත්‍ර වැඩ සටහන
අවසාන පරීක්ෂණය - 2009

ESC 2315 - මුල් ළමාවියේ සංවර්ධනය

කාලය - පැය තුනයි.

දිනය - 2009.09.05 වේලාව - පෙ.ව. 09.30- ප.ව. 12.30 දක්වා

පළමු කොටසේ **සියළුම** ප්‍රශ්නවලටද ද දෙවන කොටසින් තෝරාගත් ප්‍රශ්න **තුනකට (03)** ද පිළිතුරු සපයන්න.

## I වන කොටස

01. ළමයින්ගේ සංවර්ධනය අවබෝධ කර ගැනීම සඳහා ඔබට උපකාරී වන ප්‍රධාන මනෝවිද්‍යාත්මක ප්‍රවේශ කෙටියෙන් විස්තර කරන්න.

OPEN UNIVERSITY OF SRI LANKA
LIBRARY

02. i. 'පරිණතිය' යන පදයෙන් ඔබ අදහස් කරන්නේ කුමක් ද?

ii. ළමයෙකුගේ පරිණතිය පෙන්නුම් කරන ලක්ෂණ තුනක් සඳහන් කරන්න.

03. ළමයෙකු ඉගෙනුම සඳහා සූදානම් බව හඳුනා ගැනීමට උපකාරී වන නිර්නායක තුන කෙටියෙන් විස්තර කරන්න.

04. i. සමස්ථ සංවර්ධනයෙහි විවිධ පැතිකඩ සඳහන් කරන්න.

ii. සුදුසු උදාහරණයක් දක්වමින් ඉහත පැතිකඩ අතර අන්තර් සබඳතාවය ළමයෙකුගේ සමස්ථ සංවර්ධනයට බලපාන අන්දම කෙටියෙන් පැහැදිලි කරන්න.

05. i. ගර්භණී කාලයේ දී මවගේ සෘණ චිත්තවේගිය තත්වය ළමයාගේ සෞඛ්‍යයට බලපාන්නේ කෙසේදැයි කෙටියෙන් පැහැදිලි කරන්න.

ii. චිත්තවේගිය ව්‍යසනයන්ගෙන් ගර්භණී මවක් ආරක්ෂා කිරීම සඳහා පවුලේ සාමාජිකයන්ට දිය හැකි අවවාද තුනක් සඳහන් කරන්න.

06. i. ළදරුවෙකුට උත්තේජන ලබා දීමේදී සැලකිල්ලට ගතයුතු ප්‍රධාන සාධක දෙක නම් කරන්න.

ii. ළදරුවෙකුට උත්තේජන ලබාදීම සඳහා මවකට ගත හැකි ක්‍රියාමාර්ග 3 ක් සඳහන් කරන්න.

07. i. පෙර පාසැල් දරුවෙකුගේ මනෝ-චාලක හැකියා කෙරෙහි බලපාන සාධක දක්වන්න.

ii. කුඩා ළමයින්ගේ මනෝ චාලක හැකියා උත්තේජනය කිරීම සඳහා පෙර පාසැල් ගුරුවරියකට ගත හැකි ක්‍රියා මාර්ග 3 ක් යෝජනා කරන්න.

08. i. ළමයින්ගේ 'පරායත්ත හැසිරීම්' තුළ දැකිය හැකි ප්‍රධාන ලක්ෂණ තුන කෙටියෙන් විස්තර කරන්න.

ii. ඔබගේ පෙර පාසල් පංති කාමරය තුළ නිරීක්ෂණය කළ හැකි (අ) සමාජීය නොවූ හැසිරීම් සහ (ආ) සමාජීය හැසිරීම් සඳහා උදාහරණ 2 බැගින් දෙන්න.

(ලකුණු 5 x 8 = 40)

## II වන කොටස

09. "ළමයෙකුගේ සංවර්ධනය රඳා පවතින්නේ පරිණතිය සහ ඉගෙනුම අතර අන්තර් ක්‍රියාකාරීත්වය මතයි."

සුදුසු උදාහරණ දක්වමින් මෙම ප්‍රකාශය විභාග කරන්න.

(ලකුණු 20)

10. i. ජීන් පියාජේ යෝජනා කළ ළමා සංවර්ධනයේ අවධි හතර නම් කරන්න.

(ලකුණු 04)

ii. බුද්ධි සංවර්ධනය පිළිබඳ පියාජේගේ න්‍යාය මත පදනම් වෙමින් වයස අවුරුදු 2 - 7 වයසේ පසුවන දරුවන්ගේ සංවර්ධන අවධියේ මූලික ලක්ෂණ ලැයිස්තු ගත කරන්න. (ලකුණු 06)

iii. ඉහත අවධියේ පසුවන ළමයෙකුගේ ප්‍රධාන හැකියාව සැලකිල්ලට ගනිමින් පෙර පාසල් ළමුන්ගේ භාෂා සංවර්ධනයට උචිත ක්‍රියාකාරකමක් සැලසුම් කරන්න. එයට පහත දක්වන අංශ ඇතුළත් කළ යුතුය.

අ) ක්‍රියාකාරකමේ අරමුණු
ආ) ඉගෙනුම් උපකරණ/ආධාරක
ඇ) වර්ධනය කරන නිපුණතා
ඈ) ගුරු සහභාගිත්වය
ඉ) සිසු සහභාගිත්වය (ලකුණු 10)

11. i. උදාහරණ දක්වමින් පෙර පාසල් වියේ ළමයින් සදාචාර හැසිරීම් ඉගෙන ගන්නේ කෙසේදැයි පැහැදිලි කරන්න. (ලකුණු 07)

ii. "කුඩා දරුවන්ගේ පොදු සමාජීය හැසිරීම පිළිබඳව" පෙර පාසල් දෙමව්පියන් දැනුවත් කිරීම සඳහා සුදුසු පෝස්ටරයක් සැලසුම් කරන්න. (ලකුණු 05)

iii. කුඩා ළමුන්ගේ සමාජිකරණය සහ ඔවුන්තුල අගයන් අනුස්ථාපනය කිරීම සඳහා පෙර පාසල් ගුරුවරියකට පංති කාමරය තුල නිර්මාණය කළ හැකි අත්‍යවශ්‍ය තත්ව ඔබගේ ඉගැන්වීම පිළිබඳ අත්දැකීම් පදනම් කර ගනිමින් විභාග කරන්න.

(ලකුණු 08)

12. i. බාල ළමයින්ගේ නිර්මාණශීලිත්වය වැඩි දියුණු කිරීම සඳහා ගුරුවරයාගේ භූමිකාව කෙටියෙන් විස්තර කරන්න.

(ලකුණු 05)

ii, පෙර පාසල් ළමයින්ගේ නිර්මාණශීලිත්වය වැඩි දියුණු වන පරිදි සැකසුණු ආදර්ශ පංතිකාමර සැළසුමක් නිර්මාණය කරන්න.

(ලකුණු 05)

iii. මුල් ළමාවියේදී ළමයින් තම නිර්මාණශීලිත්වය ප්‍රකාශනය කරන්නේ කෙසේදැයි උදාහරණ දක්වමින් විශ්ලේෂණය කරන්න.

(ලකුණු 10)

13. මුල් ළමාවියේ පරිසරයන් තුළ ළමයින්ගේ පෝෂණය, සෞඛ්‍යය හා ආරක්ෂාව පිළිබඳ දක්වන සැලකිල්ල රටක සෞඛ්‍ය සම්පන්න අනාගත පරපුරක් ස්ථාපනය කිරීම සඳහා වැදගත් වේ.

මේ කර්තව්‍ය සඳහා පෙර පාසලකට දායක විය හැක්කේ කෙසේදැයි සාකච්ඡා කරන්න.

(ලකුණු 20)

- හිමිකම් ඇවිරිණි. -

LIBRARY

**THE OPEN UNIVERSITY OF SRI LANKA**
**ADVANCED CERTIFICATE PROGRAMME IN PRE-SCHOOL EDUCATION**
**FINAL EXAMINATION – 2009**
**ESC 2315 – EARLY CHILDHOOD DEVELOPMENT**

**DURATION : THREE (03) HOURS**

| **DATE : 05th September 2009** | **TIME : 09.30 a.m. – 12.30 p.m.** |
|---|---|

ANSWER ALL QUESTIONS IN PART I AND ANY THREE QUESTION IN PART II.

## PART – I

01. Briefly describe the main psychological approaches that help you to understand the development of children.

02. i. What do you mean by the term 'maturation'?
    ii. Site 3 characteristics that indicate the maturation of a child.

03. Briefly describe the three criteria to determine that a child is ready to learn.

04. i. State the different aspects of total development.
    ii. Citing an appropriate example briefly explain how the interrelation of the above aspects influence the total development of a child.

05. i. Briefly explain how the negative emotional state of the mother affect the child during the pregnancy.

    ii. State 3 advices you can given to family members of a pregnant mother in order to protect her from emotional hazards.

06. i. Name the two main factors to be considered when providing stimulations to an infant.

    ii. State 3 ways that a mother can provide stimulations to infant.

07. i. State the factors affecting the psycho-motor abilities in a preschool child.

    ii. Propose 3 appropriate actions that can be taken by a pre-school teacher to stimulate the psycho motor abilities of young children.

08. i. Briefly describe the three main characteristics that can be identified within the dependent behaviour in children.

    ii. Give 2 examples each for 'social behavioural patterns' and 'Non-social behavioral patterns' that you can observe in your pre school classroom.

(5 x 8 = 40 marks)

## PART – II

09. "Development of a child depends on the interaction of maturation and learning" Examine this statement citing suitable examples.

(20 marks)

10. i. Name the four stages of development of a child suggested by Jean Piaget.

(04 marks)

ii. Based on Piaget's theory, list the main characteristics of the developmental stages of the children passing the age 2-7 years.

(06 marks)

iii. Design an activity to develop language skills in pre school children considering the main capability of the child in the above stage of development. Following aspects should be included in this activity.

a) Objections of the activity.
b) Teaching materials/Aids
c) Competencies to developed.
d) Teacher participation
e) Student participation.

(10 marks)

11. i. Citing example, explain how children learn moral behaviours in pre school age.

(07 marks)

ii. Design a poster to give awareness to the parents of pre school children on "Common social behaviours in young children"

(05 marks)

iii. Based on your teaching experiences examine the essential conditions a pre school teacher can introduce/create in the classroom to foster socialization and value orientation in young children.

(08 marks)

12. i. Briefly describe the teachers role in developing creativity in young children.

(05 marks)

ii. Create an ideal classroom plan that helps the development of creativity in pre-school children.

(05 marks)

iii. Citing examples analyze how children express their creativity in early childhood.

(10 marks)

13. "The concern on nutrition, health and safety of early childhood is important to establish a healthy future generation in a country".
Discuss how a pre school could contribute in this regard.

(20 marks)

*- Copyrights reserved -*